# ඇමරිකන් එක්සත් ජනපද  තානාපති කාර්යාලය
කොළඹ
# ප්‍රවෘත්ති නිවේදනය
මහජන කටයුතු අංශය

දුරකථනය:  +94 (1) 249-8100                ෆැක්ස්: +94 (1) 244-9070
විද්‍යුත් තැපෑල: VanHornNT@state.gov   http://lk.usembassy.gov

නිවේදන අංක: 10223018

**එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව**
**බිම්බෝම්බ ඉවත් කිරීම සඳහා ෙරුපියල් මිලියන 600ක් ලබා දෙයි.**

කොළඹ, ඔක්තෝබර් 23: එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ආයුධ ඉවත් කිරීම හා අඩුකිරීමේ කාර්යාලයේ නියෝජිත පිරිසක්  එක්සත් ජනපදයෙන් අරමුදල් සැපයූ බිම්බෝම් ඉවත් කිරීමේ කටයුතු නිරීක්ෂණය කිරීමත්, මෙම ව්‍යාපෘතිවල ප්‍රතිලාභීන් හමු වීමත් සඳහා 2018 ඔක්තෝබර් 8 සිට 12 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. 2018 මුදල් වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සඳහා රාජ්‍ය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රුපියල් මිලියන 600ක (ඩොලර් මිලියන 3.5) පමණ ආධාර සපයා තිබේ.

මෙම කණ්ඩායම,  නැවත පදිංචි කිරීමේ අමාත්‍යංශයේ, ජාතික බිම්බෝම්බ ඉවත් කිරීමේ මධ්‍යස්ථානයේ හා ශ්‍රී ලංකා යුද හමුදාවේ ඉන්ජිනේරු බලකායේ නිලධාරීන් හමුවූ අතර  බිම් බෝම්බ ඉවත් කිරීමේ මෙහෙයුම් සමාලෝචනය කිරීම සඳහා යාපනය, කිලිනොච්චිය, වවුනියාව හා මන්නාරම  යන ප්‍රදේශවලද සංචාරය කළේය.  මෑතදී නිදහස් කරන ලද ඔවුන්ගේ ඉඩම් හා නිවාසවලට පැමිණි  පවුල් සමග පැවති සාකච්ඡාවලදී මෙම ප්‍රාදේශීය නේවාසිකයන්ගේ එදිනෙදා ජීවිතයට බිම් බොම්බ ඉවත් කිරීම බලපා ඇති ආකාරය පිළිබඳව නියෝජිත පිරිසට දැන ගැනීමට හැකි විය. මේ වන විට 2018 වර්ෂය තුළ  එක්සත් ජනපද අරමුදල් යොදා ගනිමින් වර්ග මීටර මිලියන 1.86ක්  සුරක්ෂිත කර ඇති අතර බිම්බෝම්බ 9,344 ත් හා පුපුරා නොගිය කුඩා ආයුධ හා උණ්ඩ අයිතම 8,637ක්  ආරක්ෂිත ලෙස ඉවත් කිරීමටද  හැකිවී තිබේ.

“2020 වන විට බිම් බෝම්බවලින් නිදහස් රටක් බවට පත් කිරීමට කටයුතු කරන ශ්‍රී ලංකාවේ ජාතික බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රමෝපායට  ආධාර කිරීමට ලැබීම අපේ ආඩම්බරයට හේතු වේ“ යයි  නියෝජ්‍ය තානාපති රොබට් හිල්ටන් ප්‍රකාශ කළේය. “පුරවැසියන්ට සුරක්ෂිත ලෙස ඔවුන්ගේ නිවාස, ව්‍යාපාර, පාසැල් හා පූජනීය ස්ථාන ආදියට යෑමට ඉඩ සලසමින්  සාමය හා සන්හිඳියාව වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකාව ගන්නා උත්සාහයට බිම්බෝම්බ ඉවත් කිරීම කෙළින්ම ආධාරයක් වේ“

ශ්‍රී ලංකාවේ පුපුරන උවදුරු තුරන් කිරීම සඳහා 2002 වර්ෂයේ සිට එක්සත් ජනපදය ශ්‍රී ලංකා රුපියල් බිලියන 9.5කට (ඩොලර් මිලියන 56) වැඩි ප්‍රමාණයක ආධාර ලබා දී ඇත. එක්සත් ජනපදයෙන් සැපයූ අරමුදල් හා ශ්‍රී ලංකා යුද හමුදාවේ සහයෝගයෙන් 2017 දී මඩකලපුව දිස්ත්‍රික්කය බිම් බෝම්බවලින් තොර කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට හැකි විය. බිම් බෝම්බ දූෂණයට ලක්වී ඇති අනිත් දිස්ත්‍රික්ක අටේ ඒවා ඉවත් කිරීමට එක්සත් ජනපදය  දිගටම අරමුදල් සපයන අතර දැනට උතුරු හා නැගෙනහිර පළාත්වල බෝම්බ ඉවත් කිරීමේ රැකියා  664ක් සඳහා ආධාර කරයි.

බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතුවලට  එක්සත් ජනපද රජය ආධාර කරන්නේ දේශිය හවුල්කරු වන ‘ඩෙල්වොන් ඇසෝසියේෂන් ෆෝ සෝෂල් හාර්මනි‘ (Delvon Association for Social Harmony) හා ‘හලෝ ට්‍රස්ට්‘ (HALO Trust) හා ‘මයින්ස් ඇඩ්වයිසරි ගෘප්‘ (Mines Advisory Group) වැනි ජාත්‍යන්තර හවුල්කරුවන් මගිනි. බිම් බෝම්බ  සොයාගැනීම සඳහා විශේෂයෙන් පුහුණු කරන ලද බල්ලන්  සැපයීම ඇතුළු ශ්‍රී ලංකා යුද හමුදාවේ පුහුණු කටයුතු හා උපකරණ සඳහාද එක්සත් ජනපදය අරමුදල් සපයා තිබේ. ‘ස්පිරිට් ඔෆ් සොකර්‘ (Spirit of Soccer) නම්  ජාත්‍යන්තර හවුල්කරු මගින්  එක්සත් ජනපදය බිම් බෝම්බ අවදානම පිළිබඳ දැනුවත් කිරීමේ කටයුතුවලට ද  අරමුදල් සපයා ඇත..